# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1807/2 - 2013 අප්‍රේල් මස 22 වැනි සඳුදා - 2013.04.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මහා නගර සභා

දකුණු පළාතේ පළාත් සභාව

දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍ය හා මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ප්‍රවාහන, ජලසම්පාදන හා ජලාපවහන, විදුලිබල, ඉංජිනේරු සේවා, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සහ පළාත් පාලන අමාත්‍ය ගුස්තිඤ්ඤා වඩු ෂාන් විජයලාල් ද සිල්වා වන මා විසින් සකස් කර අංක 1780/20 හා 2012.10.18 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කර පනවන ලද මහා නගර සභා නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති හා සභිකයින් සඳහා වන ගමන් වියදම්වලට අදාළ නියෝග මෙයින් අවලංගු කරනු ලැබේ.

තව ද, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතෙහි 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 252 වැනි අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 289 වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සකස් කරන ලද මහා නගර සභා නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති හා සභිකයින් සඳහා වන ගමන් වියදම් දීමනාවලට අදාළ නියෝග මෙයින් පනවනු ලැබේ. මෙම නියෝග 2012.01.01 දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

ගුස්තිඤ්ඤා වඩු ෂාන් විජයලාල් ද සිල්වා,
දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍ය හා මුදල්, ක්‍රමසම්පාදන,
නීතිය හා සාමය, ප්‍රවාහන, ජලසම්පාදන හා ජලාපවහන,
විදුලිබල, ඉංජිනේරු සේවා, සෞඛ්‍ය,
දේශීය වෛද්‍ය සහ පළාත් පාලන අමාත්‍ය.

2013 අප්‍රේල් මස 11 වැනි දින,
ගාල්ල, දකුණු පළාත් සභාවේ,
මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ප්‍රවාහන,
ජලසම්පාදන හා ජලාපවහන, විදුලිබල, ඉංජිනේරු සේවා,
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සහ පළාත් පාලන අමාත්‍යාංශයේ දී ය.

### නියෝග

01. මෙම නියෝග මහා නගර සභාවේ නගරාධිපතිවරුන්ට, නියෝජ්‍ය නගරාධිපතිවරුන්ට, සභිකයින්ට ගමන් වියදම් දීමනා ගෙවීමේ නියෝග ලෙස හඳුන්වනු ලැබේ.


1A - PG 001611— 485 (2013/04)



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

02. මහා නගර සභාවක නගරාධිපතිවරයෙකුට, නියෝජ්‍ය නගරාධිපතිවරයෙකුට හෝ සභිකයෙකුට මහජන නියෝජිතයෙකු වශයෙන් පැවරී ඇති කාර්යයන්/සභාව මගින් පවරන ලද කාර්යයන් සඳහා ස්වකීය වාහනයෙන් හෝ පොදු වාහනයෙන් ගමන් කිරීමේ දී දරනු ලබන වියදම් ප්‍රතිපූර්ණය කිරීමක් වශයෙන් මසකට රු. 3,000.00ක උපරිමයකට යටත්ව ගමන් වියදම් දීමනාවක් ගෙවනු ලැබිය හැකි ය.

03. මෙහි දී යොදවා ගනු ලබන්නේ ස්වකීය මෝටර් රථය/ත්‍රිරෝද රථය හෝ යතුරු පැදිය නොවේ නම්, පහත ලේඛන ඉදිරිපත් කර ඇති විටෙක එය ස්වකීය මෝටර් රථය/ත්‍රීරෝද රථය හෝ යතුරු පැදිය සේ සළකා කටයුතු කළ හැකි ය.

අදාළ මෝටර් රථයේ/ත්‍රිරෝද රථයේ හෝ යතුරු පැදියේ ඃ

(i) ලියාපදිංචි සහතිකයේ සහතික කළ පිටපත ;
(ii) වාර්ෂික ආදායම් බලපත්‍රයේ සහතික කළ පිටපත ;
(iii) වලංගු රක්ෂණාවරණ සහතිකයේ සහතික කළ පිටපත ;
(iv) හිමිකරු විසින් මෝටර් රථය/ත්‍රීරෝද රථය හෝ යතුරු පැදිය පාවිච්චි කිරීමට අවසර දෙමින් ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශය.

04. ගමන් වියදම් දීමනාව ලබා ගැනීමේ දී ඉන්ධන බිල්පත් සහ පොදු වාහනයෙන් ගමන් කළේ නම් ඊට අදාළ බිල්පත් ඉදිරිපත් කිරීම කළ යුතු ය.

05. ගමන් වියදම් දීමනාව ගෙවීමට පෙර සභාවේ අනුමැතිය ලබාගත යුතු අතර, ඒ සඳහා වාර්ෂික අයවැය ලේඛනයෙහි ප්‍රතිපාදන සලසා ගෙන තිබිය යුතු ය.

05-102/1

---

## නගර සභා

### දකුණු පළාතේ පළාත් සභාව

දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍ය හා මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ප්‍රවාහන, ජලසම්පාදන හා ජලාපවහන, විදුලිබල, ඉංජිනේරු සේවා, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සහ පළාත් පාලන අමාත්‍ය ගුස්තිඤ්ඤා වඩු ෂාන් විජයලාල් ද සිල්වා වන මා විසින් සකස් කර අංක 1780/20 හා 2012.10.18 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කර පනවන ලද නගර සභා සභාපති, උප සභාපති හා සභිකයින් සඳහා වන ගමන් වියදම්වලට අදාළ රීති මෙයින් අවලංගු කරනු ලැබේ.

තව ද, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතෙහි 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 252 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 193(2)(ඌ) වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සකස් කරන ලද නගර සභා සභාපති, උප සභාපති හා සභිකයින් සඳහා වන ගමන් වියදම් දීමනාවලට අදාළ රීති මෙයින් පනවනු ලැබේ. මෙම රීති 2012.01.01 දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

ගුස්තිඤ්ඤා වඩු ෂාන් විජයලාල් ද සිල්වා,
දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍ය හා මුදල්, ක්‍රමසම්පාදන,
නීතිය හා සාමය, ප්‍රවාහන, ජලසම්පාදන හා ජලාපවහන,
විදුලිබල, ඉංජිනේරු සේවා, සෞඛ්‍ය,
දේශීය වෛද්‍ය සහ පළාත් පාලන අමාත්‍ය.

2013 අප්‍රේල් මස 11 වැනි දින,
ගාල්ල, දකුණු පළාත් සභාවේ,
මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ප්‍රවාහන,
ජලසම්පාදන හා ජලාපවහන, විදුලිබල, ඉංජිනේරු සේවා,
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සහ පළාත් පාලන අමාත්‍යාංශයේ දී ය.

**රීති**

01. මෙම රීති නගර සභාවේ සභාපතිවරුන්ට, උප සභාපතිවරුන්ට, සභිකයින්ට ගමන් වියදම් දීමනා ගෙවීමේ රීති ලෙස හඳුන්වනු ලැබේ.

02. නගර සභාවක සභාපතිවරයෙකුට, උප සභාපතිවරයෙකුට හෝ සභිකයෙකුට මහජන නියෝජිතයෙකු වශයෙන් පැවරී ඇති කාර්යයන්/සභාව මගින් පවරන ලද කාර්යයන් සඳහා ස්වකීය වාහනයෙන් හෝ පොදු වාහනයෙන් ගමන් කිරීමේ දී දරනු ලබන වියදම් ප්‍රතිපූර්ණය කිරීමක් වශයෙන් මසකට රු. 3,000.00ක උපරිමයකට යටත්ව ගමන් වියදම් දීමනාවක් ගෙවනු ලැබිය හැකි ය.

03. මෙහි දී යොදවා ගනු ලබන්නේ ස්වකීය මෝටර් රථය/ත්‍රිරෝද රථය හෝ යතුරු පැදිය නොවේ නම්, පහත ලේඛන ඉදිරිපත් කර ඇති විටෙක එය ස්වකීය මෝටර් රථය/ත්‍රිරෝද රථය හෝ යතුරු පැදිය සේ සලකා කටයුතු කළ හැකි ය.

අදාළ මෝටර් රථයේ/ත්‍රිරෝද රථයේ හෝ යතුරු පැදියේ ඃ

(i) ලියාපදිංචි සහතිකයේ සහතික කළ පිටපත ;
(ii) වාර්ෂික ආදායම් බලපත්‍රයේ සහතික කළ පිටපත ;
(iii) වලංගු රක්ෂණාවරණ සහතිකයේ සහතික කළ පිටපත ;
(iv) හිමිකරු විසින් මෝටර් රථය/ත්‍රිරෝද රථය හෝ යතුරු පැදිය පාවිච්චි කිරීමට අවසර දෙමින් ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශය.

04. ගමන් වියදම් දීමනාව ලබා ගැනීමේ දී ඉන්ධන බිල්පත් සහ පොදු වාහනයෙන් ගමන් කළේ නම් ඊට අදාළ බිල්පත් ඉදිරිපත් කිරීම කළ යුතු ය.

05. ගමන් වියදම් දීමනාව ගෙවීමට පෙර සභාවේ අනුමැතිය ලබාගත යුතු අතර, ඒ සඳහා වාර්ෂික අයවැය ලේඛණයෙහි ප්‍රතිපාදන සලසා ගෙන තිබිය යුතු ය.

05-102/2

---

**ප්‍රාදේශීය සභා**

**දකුණු පළාතේ පළාත් සභාව**

දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍ය හා මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ප්‍රවාහන, ජලසම්පාදන හා ජලාපවහන, විදුලිබල, ඉංජිනේරු සේවා, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සහ පළාත් පාලන අමාත්‍ය ගුස්තිඤ්ඤා වඩු ෂාන් විජයලාල් ද සිල්වා වන මා විසින් සකස් කර අංක 1780/20 හා 2012.10.18 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කර පනවන ලද ප්‍රාදේශීය සභා සභාපති, උප සභාපති හා සභිකයින් සඳහා වන ගමන් වියදම්වලට අදාළ රීති මෙයින් අවලංගු කරනු ලැබේ.

තව ද, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතෙහි 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 184 වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සකස් කරන ලද ප්‍රාදේශීය සභා සභාපති, උප සභාපති හා සභිකයින් සඳහා වන ගමන් වියදම් දීමනාවලට අදාල රීති මෙයින් පනවනු ලැබේ. මෙම රීති 2012.01.01 දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

ගුස්තිඤ්ඤා වඩු ෂාන් විජයලාල් ද සිල්වා,
දකුණු පළාතේ ප්‍රධාන අමාත්‍ය හා මුදල්, ක්‍රමසම්පාදන,
නීතිය හා සාමය, ප්‍රවාහන, ජලසම්පාදන හා ජලාපවහන,
විදුලිබල, ඉංජිනේරු සේවා, සෞඛ්‍ය,
දේශීය වෛද්‍ය සහ පළාත් පාලන අමාත්‍ය.

2013 අප්‍රේල් මස 11 වැනි දින,
ගාල්ල, දකුණු පළාත් සභාවේ,
මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ප්‍රවාහන,
ජලසම්පාදන හා ජලාපවහන, විදුලිබල, ඉංජිනේරු සේවා,
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සහ පළාත් පාලන අමාත්‍යාංශයේ දී ය.

**රීති**

01. මෙම රීති ප්‍රාදේශීය සභාවේ සභාපතිවරුන්ට, උප සභාපතිවරුන්ට, සභිකයින්ට ගමන් වියදම් දීමනා ගෙවීමේ රීති ලෙස හඳුන්වනු ලැබේ.

02. ප්‍රාදේශීය සභාවක සභාපතිවරයෙකුට, උප සභාපතිවරයෙකුට හෝ සභිකයෙකුට මහජන නියෝජිතයෙකු වශයෙන් පැවරී ඇති කාර්යයන්/සභාව මගින් පවරන ලද කාර්යයන් සඳහා ස්වකීය වාහනයෙන් හෝ පොදු වාහනයෙන් ගමන් කිරීමේ දී දරනු ලබන වියදම් ප්‍රතිපූර්ණය කිරීමක් වශයෙන් මසකට රු. 3,000.00ක උපරිමයකට යටත්ව ගමන් වියදම් දීමනාවක් ගෙවනු ලැබිය හැකි ය.

03. මෙහි දී යොදවා ගනු ලබන්නේ ස්වකීය මෝටර් රථය/ත්‍රිරෝද රථය හෝ යතුරු පැදිය නොවේ නම්, පහත ලේඛන ඉදිරිපත් කර ඇති විටෙක එය ස්වකීය මෝටර් රථය/ත්‍රිරෝද රථය හෝ යතුරු පැදිය සේ සළකා කටයුතු කළ හැකි ය.

අදාළ මෝටර් රථයේ/ත්‍රිරෝද රථයේ හෝ යතුරු පැදියේ ඃ

(i) ලියාපදිංචි සහතිකයේ සහතික කළ පිටපත ;
(ii) වාර්ෂික ආදායම් බලපත්‍රයේ සහතික කළ පිටපත ;
(iii) වලංගු රක්ෂණාවරණ සහතිකයේ සහතික කළ පිටපත ;
(iv) හිමිකරු විසින් මෝටර් රථය/ත්‍රිරෝද රථය හෝ යතුරු පැදිය පාවිච්චි කිරීමට අවසර දෙමින් ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශය.

04. ගමන් වියදම් දීමනාව ලබා ගැනීමේ දී ඉන්ධන බිල්පත් සහ පොදු වාහනයෙන් ගමන් කළේ නම් ඊට අදාළ බිල්පත් ඉදිරිපත් කිරීම කළ යුතු ය.

05. ගමන් වියදම් දීමනාව ගෙවීමට පෙර සභාවේ අනුමැතිය ලබාගත යුතු අතර, ඒ සඳහා වාර්ෂික අයවැය ලේඛණයෙහි ප්‍රතිපාදන සලසා ගෙන තිබිය යුතු ය.

05-102/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.